# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2286/12 - 2022 ජුනි මස 27 වැනි සඳුදා - 2022.06.27

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව

නිවේදනය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වැනි ව්‍යවස්ථාවේ (1)(අ) අනු ව්‍යවස්ථාව යටතේ මා වෙත පැවරී ඇති බලතල ක්‍රියාත්මක කරමින්, ම විසින් 2022 ජුනි මස 09 දිනැති අංක 2283/34 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද නිවේදනය මගින් සංශෝධිත, 2022 මැයි මස 27 දිනැති අංක 2281/41 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද නිවේදනය, 2022 ජුනි මස 24 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි පහත උපලේඛනයේ සඳහන් වන පරිදි තවදුරටත් සංශෝධනය කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ගෝඨාභය රාජපක්ෂ,
ජනාධිපති.

2022 ජුනි මස 27 වැනි දින,
කොළඹ 01,
ජනාධිපති කාර්යාලයේ දී ය.

උපලේඛනය

(1) එම නිවේදනයෙහි අංක "27. තාක්ෂණ හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍ය " ශීර්ෂය සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි :-

(අ) එම ශීර්ෂය "27. තාක්ෂණ අමාත්‍ය" වශයෙන්,

(ආ) එහි I වැනි තීරුවෙහි 1 වැනි අයිතමය වෙනුවට පහත අයිතමය ආදේශ කිරීමෙන් ;

1. "සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුකූලව සහ රජය මගින් ක්‍රියාත්මක කරනු ලබන ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා තාක්ෂණ විෂයයට සහ II වැනි තීරුවෙහි දැක්වෙන දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථාවන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම

(ඇ) එහි I වැනි තීරුවෙහි අංක 11, 12 සහ අංක 15 සිට 18 දක්වා අයිතමයන් ඉවත් කිරීමෙන් ;

(ඈ) එහි I වැනි තීරුවෙහි අංක 13, 14, 19 සහ 20 අයිතමයන් පිළිවෙලින් අංක 11 සිට 14 දක්වා වශයෙන් නැවත අංක ගත කිරීමෙන්;

(ඉ) එහි II වැනි තීරුවෙහි අංක 2, 7, 8, 9, 14 සහ 15 අයිතමයන් ඉවත් කිරීමෙන් ;

(ඊ) එහි II වැනි තීරුවෙහි අංක 3 සිට 6 දක්වා, අංක 10 සිට 13 දක්වා අයිතමයන් පිළිවෙලින් අංක 2 සිට 9 දක්වා වශයෙන් නැවත අංක ගත කිරීමෙන් ;

(උ) එහි III වැනි තීරුවෙහි දැක්වෙන පහත සඳහන් අයිතමයන් ඉවත් කිරීමෙන් ;

- ආගාමික හා විගාමික පනත (1948 අංක 20)
- පුරවැසි පනත (1948 අංක 18)
- ඉන්දීය සම්භවයක් ඇති තැනැත්තන්ට පුරවැසිභාවය ප්‍රදානය කිරීමේ පනත (2003 අංක 35)
- අදේශික තැනැත්තන්ට පුරවැසිභාවය ප්‍රදානය කිරීමේ පනත (1986 අංක 5)
- අදේශිකයින්ට පුරවැසිභාවය ප්‍රදානය කිරීමේ (විශේෂ විධිවිධාන) පනත (1988 අංක 39)
- මහ කොළඹ ආර්ථික කොමිෂන් සභා නීතිය (1978 අංක 4) (ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය නීතිය)
- කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනත (2021 අංක 11)

(2) එම නිවේදනයෙහි අංක “ 28. කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍ය” ශීර්ෂයෙහි I වන, II වන සහ III වන තීරු වලට පසුව පහත සඳහන් නව ශීර්ෂය ඇතුලත් කිරීමෙන්;

**29. ආයෝජන ප්‍රවර්ධන අමාත්‍ය**

| *I වැනි තීරුව* | *II වැනි තීරුව* | *III වැනි තීරුව* |
|---|---|---|
| *කාර්යයන් හා කර්තව්‍යයන්* | *දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *ක්‍රියාත්මක කළයුතු නීති සහ අණ පනත්* |
| 1. “සෞභාග්‍යයේ දැක්ම” ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුකූලව සහ රජය මගින් ක්‍රියාත්මක කරනු ලබන ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා ආයෝජන ප්‍රවර්ධන විෂයයට සහ II වැනි තීරුවෙහි දැක්වෙන දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථාවන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම<br>2. අමාත්‍යාංශ විෂය පථයට අයත්වන මහජන සේවාවන් කාර්යක්ෂමව හා මහජන හිතකාමී අයුරින් ලබා දීම<br>3. නාස්තිය හා දූෂණය පිටු දකිමින් අමාත්‍යාංශයේ කාර්යභාරය ඉටු කිරීම සහතික කිරීමට ඉවහල් වන ආකාරයට නවීන කලමනාකරණ ක්‍රම හා තාක්ෂණය යොදා ගනිමින් සියලුම ක්‍රම සහ විධි ප්‍රතිසංස්කරණය කිරීම<br>4. ශ්‍රී ලංකාව තුළ ආර්ථික විභවතාව ප්‍රවර්ධනය කරමින් විදේශීය ඍජු ආයෝජන සහ පුද්ගලික අංශයේ ආයෝජන ප්‍රවර්ධනය කිරීම | 1. ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය<br>2. කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව<br>3. කොළඹ වරාය නගරය ආශ්‍රිත ව්‍යාපෘතිය<br>4. ආගමන හා විගමන දෙපාර්තමේන්තුව<br>5. කලම්බු ලෝටස් ටවර් මැනේජ්මන්ට් කම්පැනි ප්‍රයිවට් ලිමිටඩ්<br>6. ටෙක්නො පාක් ඩිවලොප්මන්ට් කම්පැනි ප්‍රයිවට් ලිමිටඩ්<br>7. තොරතුරු තාක්ෂණ උද්‍යාන | • මහ කොළඹ ආර්ථික කොමිෂන් සභා නීතිය (1978 අංක 4) (ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය නීතිය)<br>• කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනත (2021 අංක 11)<br>• ආගාමික හා විගාමික පනත (1948 අංක 20)<br>• පුරවැසි පනත (1948 අංක 18)<br>• ඉන්දීය සම්භවයක් ඇති තැනැත්තන්ට පුරවැසිභාවය ප්‍රදානය කිරීමේ පනත (2003 අංක 35)<br>• අදේශික තැනැත්තන්ට පුරවැසිභාවය ප්‍රදානය කිරීමේ පනත (1986 අංක 5)<br>• අදේශිකයින්ට පුරවැසිභාවය ප්‍රදානය කිරීමේ (විශේෂ විධිවිධාන) පනත (1988 අංක 39)<br>• වෙනත් අමාත්‍යවරයෙක් යටතට නිශ්චිතව පවරා නොමැති, මෙහි I හා II තීරුවල සඳහන් විෂයයන්ට අදාළ අනෙකුත් සියලු ව්‍යවස්ථාවන් |

**29. ආයෝජන ප්‍රවර්ධන අමාත්‍ය** *(සම්බන්ධිතයි)*

| *I වැනි තීරුව* | *II වැනි තීරුව* | *III වැනි තීරුව* |
|---|---|---|
| *කාර්යයන් හා කර්තව්‍යයන්* | *දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *ක්‍රියාත්මක කළයුතු නීති සහ අණ පනත්* |
| 5. කලාපීය වෙළඳ හා ආයෝජන සහයෝගීතාවය ඉහළ නැංවීම අරමුණු කර ගත් ප්‍රතිපත්ති, උපායමාර්ග, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය<br>6. ආර්ථික සංවර්ධන කලාප ප්‍රවර්ධනය, නියාමනය සහ අධීක්ෂණය<br>7. ජාතික යහපත සහ ආර්ථික දියුණුව අරමුණු කරගෙන විශේෂිත යටිතල සහ අනෙකුත් පහසුකම් සහිත ජාත්‍යන්තර ව්‍යාපාර හා සේවා කේන්ද්‍රස්ථානයක් වශයෙන් කොළඹ වරාය නගරය විශේෂ ආර්ථික කලාපය සංවර්ධනය කිරීම<br>8. ආගමන හා විගමන කටයුතු<br>9. කොළඹ නෙළුම් කුළුණ ව්‍යාපාර මොඩලයක් බවට පත්කර සංචාරක මධ්‍යස්ථානයක් වශයෙන් ප්‍රවර්ධනය කිරීම<br>10. ඩිජිටල් රාජ්‍ය ක්‍රමෝපායන් සම්පාදනය කිරීම<br>11. තාක්ෂණ උද්‍යාන ඇති කිරීම්<br>12. ඩිජිටල් තාක්ෂණ ව්‍යාපාර පුළුල් කිරීම සම්බන්ධ කටයුතු<br>13. II තීරුවෙහි දැක්වෙන ආයතනයන්ට පැවරී ඇති අනෙකුත් සියලුම විෂයයන්ට අදාළ කටයුතු<br>14. II තීරුවෙහි දැක්වෙන සියලුම ආයතනයන් අධීක්ෂණය කිරීම | | |